# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,353—1945ක්වූ ජනවාරි මස 5 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ නාවයුක්තකව, එනම්:—සමසහාපාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "(203 පරිච්ඡේදය) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

පිහියකමේ අංක. A 846. ගම—ඉහළ කටුනේරිය.

| අංක. | ඉඩමේ නම. | අත්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලගහවත්ත | .. පොල්වත්ත, අවුරුදු 40ක් පමණ වයසැති, පොල් පැල 1 වයස අවුරුදු 2ක් පමණ | ඇම්. පේදුරු ප්‍රනාන්දු, ඉහළ කටුනේරිය | 0 0 1·8 |
| 2 | එම | .. පොල්වත්ත, අවුරුදු 40ක් පමණ පොල්ගස් 3ක් | ඩබ්ලිව්. ඇම්. ඒ. ප්‍රනාන්දු, ඉහළ කටුනේරිය | 0 0 13·2 |
| 3 | එම | .. පොල්වත්ත, අවුරුදු 40ක් පමණ වයස, වැට්ලක් නැත | ඩබ්ලිව්. ඇම්. ඒ. ප්‍රනාන්දු සහ ඇම්. ඇල්. ප්‍රනාන්දු, ඉහළ කටුනේරිය | 0 0 3·9 |
| 4 | එම | .. පොල්වත්ත, අවුරුදු 40ක් පමණ පොල්පැල 3යි | ඇම්. ඇල්. ප්‍රනාන්දු, ඉහළ කටුනේරිය | 0 0 9·5 |
| 5 | එම | .. පොල්වත්ත, පැල 7යි, කොස්ගස් 1යි, වයස අවුරුදු 40යි | ඩබ්ලිව්. ඇම්. ඒ. ප්‍රනාන්දු, ඉහළ කටුනේරිය | 0 0 14 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මගින් 1945ක්වූ ජනවාරි මස 29වෙනි දින පෙරවරූ 11.45ට හලාවත පළාත් ආදායම් පාලකතුමාගේ කාර්යාලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1944ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින පුත්තලම් කච්චේරියේදිය.

ඇස්. ඇම්. බ්ජ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

ආණ්ඩුවේ නාවයුක්තකව, එනම්:—තුන්කොට ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් ඉදිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "(203 පරිච්ඡේදයේ) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

පිහියකමේ අංක. P. P. A 477. ගම—මහ පල්ලෙගම.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රුක්ගහමඩිත්තේ ගෙන්නේවත්ත | වතුන, පොල්ගස් 3, කොස්ගස් 1 සහ පුවක්ගස් 4, වයස අවුරුදු 30, පොල්ගස් 92, කොස්ගස් 158, පුවක්ගස් 2,260, රබර්ගස් 28, දෙල්ගස් 5, දොඩම්ගස් 5, අඹගස් 20, කෙසෙල්පඳුරු 32 සහ කටුසර මඩුවක්; වයස අවුරුදු $1\frac{1}{2}$යි | ගොඩයලගේ ගෙන්දා, එමගේ පොඩිනා, එමගේ මාජිසා, එමගේ බෙබී, එමගේ ඩිංගිරි, එමගේ සොමලියා, බාලසූරියමුදියන්සේලාගේ උක්කුබණ්ඩා, රාජපක්ෂ ආරච්චිලාගේ ජුවන් අප්පුහාමි, වෙදරාලලාගේ මොහොට්ටි අප්පුහාමි, හෙට්ටිආරච්චිපතිරන්නැහෙලාගේ එමලින් හාමිනා, පල්ලේගමරාලලාගේ පොඩිරාලහාමි, අවලගමරාල්ලාගේ තෝමිස් සිංඤෝ, වෙදරාලලාගේ හෙන්ද්‍රික් අප්පුහාමි සහ පල්ලේවෙලගේ සිංඤෝ; පල්ලේගම පදිංචිකාරයෝ | 1 3 0·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මගින් 1945ක්වූ පෙබරවාරි මස 15වෙනි දින පස්වරූ 3.30ට කෑගල්ල දිස්ත්‍රික් සමට දුම්ගම හැසි බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1944ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින කෑගල්ලේ කච්චේරියේදිය.

බී. ඇෆ්. පෙරේරා,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

## ටෙන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි මෙහි පහත සඳහන් රජයන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්වෙලෝප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වන 1945ක්වූ ජනවාරි මස 30වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් කිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාසයක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තෙහි නම් ඔහු විසින් ගෙවනලද මුදල රජයන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලයතුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට වෙන තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලක්වීමටත් සබරගමු පළාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩපටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. මෙම ඉඩම්වල බිම් ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අන්දමකින් ඉඩම්වල හරි සම්පූර්ණ බිම් ප්‍රමාණය මෙහි පහත සඳහන් බිම් ප්‍රමාණයට වඩා අඩු බව දෙවනු පෙනීගියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩි නූණේ නම් බිම් ප්‍රමාණයේ අඩුලුහුඩුකම සම්බන්ධව මුදල් ආපසු ගැනීමට හෝ අඩුකරගැනීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවට ගනු නොලැබේ.

11. වැඩිදුර කාරණ සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

(1) කුකුළුකෝරළේ කලවානේ පිහිටි දිගින් දම්වැල් 17ක් පමණ විශාලකම ඇති තිනිබිමිටඇලට මායිම් :—(බ්ලොක් A.)

උතුරට: දකුණු ඉවුරද,

නැගෙනහිරට: බ්ලොක් B,

දකුණට: වම් ඉවුරද,

බස්නාහිරට: දෙලේ උතුරු කොටස.

(2) කුරුවිටිකෝරළේ ඇරැපොල පිහිටි දිගින් දම්වැල් 15ක් පමණ විශාලකම ඇති මහාදෙලට මායිම් :—බ්ලොක් A.

උතුරට: මිරිපොල සිට ඇහැලියගොඩට යන ගම්සභාපාර,

නැගෙනහිරට: දකුණු ඉවුර,

දකුණට: බ්ලොක් B,

බස්නාහිරට: දෙලේ වම් ඉවුරද.

(3) නවදුන්කෝරළේ හත්ගොමුවේ පිහිටි දිගින් දම්වැල් 10ක් පමණ විශාලකම ඇති හත්ගොමුගඟට මායිම් :—

උතුරට: දෙලේ උතුරු කොටසද,

නැගෙනහිරට: දකුණු ඉවුරද,

දකුණට: බ්ලොක් බී සහ බස්නාහිරට: වම් ඉවුරද, (දම්වැල් 10ය ඒ සිට බී දක්වා).

(4) නවදුන්කෝරළේ හත්ගොමුවේ පිහිටි දිගින් දම්වැල් 10ක් පමණ විශාලකම ඇති හත්ගොමුගඟට මායිම් :—

උතුරට: බ්ලොක් ඒද,

නැගෙනහිරට: දකුණු ඉවුරද,

දකුණට: දෙලේ උතුරු කොටස සහ අරුපොල ගම් මායිමද,

බස්නාහිරට: වම් ඉවුරද.

(5) කුරුවිටිකෝරළේ ගැටහැත්තේ පිහිටි දිගින් දම්වැල් 13ක් පමණ විශාලකම ඇති ගැටහැතිඔයට මායිම් :—

උතුරට: ලොට් නො. 38 සහ 75ද,

නැගෙනහිරට: පාලමට අත්හැරිය කොටසද,

දකුණට: ලොට් නො. 73 සහ 68ද,

බස්නාහිරට: පාලමට අත්හැරිය කොටසද.

(6) කුරුවිටිකෝරළේ මුරුතහපිටියේ පිහිටි දිගින් දම්වැල් 4ක් පමණ විශාලකම ඇති පොත්දෙනියේ දෙලට මායිම් :—(සිතියමේ A සිට B දක්වා).

උතුරට: පොත්දෙනියේ දෙලේ උතුරු කොටසද,

නැගෙනහිරට: දකුණු ඉවුරද,

දකුණට: පලිහල ගම් මායිමද සහ අගලද,

බස්නාහිරට: වම් ඉවුරද.

(7) නවදුන්කෝරළේ ඔලිඹත්ගොඩ පිහිටි රූඩ් 3ක් පමණ විශාලකම ඇති හාකැලේගේ නැමති ඉඩමට මායිම් :—

උතුරට: නො. 51 පැලෑනේ ලොට් නො. 8ද,

නැගෙනහිරට: ලොට් නො. 13ද,

දකුණට: ලොට් නො. 6 L උතුරු කොටසද,

බස්නාහිරට: මහදෙලද.

බී. වනසුන්දර,
සබරගමු පළාතේ ආණ්ඩුවේ සහාය ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

මේ 1945ක්වූ ජනවාරි මස 2වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

## ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීමයි.

සිලෝන් සේවිංස් බැංකුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියෝගය යටතේ 1945 අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය සියයට 3ක් බව එම බැංකුවේ ඩිරෙක්ටර්වරුන් විසින් දන්වා සිටිනු ලැබේ.

ඇල්. එච්. මෙව්ස්ලිං,
වැඩබලන සෙක්‍රටාරිස්තැන.

මේ 1945ක්වූ ජනවාරි මස 3වෙනි දින
කොළඹ සිලෝන් සේවිංස් බැංකුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.